# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2025.09.15 |


## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2025 අගෝස්තු


**2025 අගෝස්තු මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.**

**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 55.2ක අගයක් වාර්තා කළේය.** මෙමගින් පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද නිෂ්පාදන කටයුතුවල වර්ධනයක් පිළිබිඹු කරනු ලැබීය. මෙහිදී, සියලුම උප දර්ශක කඩඉම් මට්ටමට වඩා ඉහළ අගයක පැවතුනි.

අගෝස්තු මාසය තුළ දී නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකවල වර්ධනයට ප්‍රධාන වශයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වය දායක විය. නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් අනුව යමින් තොග මිලදී ගැනුම් උප දර්ශකය ද වර්ධනයක් වාර්තා කළේය. අගෝස්තු මාසයේ දී යහපත් රැකියා තත්වයන් පෙන්නුම් කරමින් සේවා නියුක්ති උප දර්ශකය කඩයිම් මට්ටමට වඩා ඉහළ අගයක පැවතුනි. මේ අතර, සැපයුම්කරුවන්ගේ බෙදාහැරීමේ කාලය මාසය තුළ දී තවදුරටත් දිගු වූ අතර, ප්‍රතිචාර දැක්වූ ඇතැම් අය විසින් නැව්ගත කිරීමේ ප්‍රමාදයන් වාර්තා කරන ලදී.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 55.2 |
|---|---|
| 2025 අගෝස්තු | |

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **62.2** | **55.2** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 67.5 | 56.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 66.5 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.0 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 59.5 | 53.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 55.6 | 57.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර අවසානයේ සෘතුමය ඉල්ලුම ඉහළ යෑමේ බලාපොරොත්තු හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ධනාත්මකව පවතී.

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 සැප්තැම්බර් 15 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්වල තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2025 අගෝස්තු මාසයේ දී පසුගිය වසරේ අනුරූප කාලය තුළ දී දක්නට ලැබුණු ප්‍රවණතාවයට සමානව යමින්, දර්ශකාංක 68.9ක අගයක් වාර්තා කළේය.**

2025 අගෝස්තු මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව ඉහළ ගිය අතර, ඒ සඳහා බොහෝ අංශවල සිදු වූ වර්ධනයන් හේතු විය. තොග සහ සිල්ලර වෙළඳාම, අනෙකුත් පුද්ගලික සේවා, සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යාම මධ්‍යයේ නවාතැන් පහසුකම්, සහ ආහාර පාන සේවා යන අංශවල වාර්තා වූ ශක්තිමත් ක්‍රියාකාරිත්වය මෙම ප්‍රසාරණයට හේතු විය. තවද, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් තොග සහ සිල්ලර වෙළඳාම සහ මූල්‍ය සේවා යන අංශවල සිදු වූ වර්ධනයත් සමඟ 2025 අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

දැනට පවත්නා මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම් කිහිපයක සිදු වූ නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය 2025 අගෝස්තු මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය. කෙසේ වුවද, නිම කිරීමට නියමිත කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූලි | අගෝස්තු | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **70.1** | **68.9** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 64.9 | 66.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 59.8 | 57.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 51.1 | 49.4 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 80.7 | 79.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, යහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ඉහළ සංචාරක පැමිණීම් ඇතුළු සෘතුමය සාධක හේතුවෙන් අඛණ්ඩව වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**68.9**

**2025 අගෝස්තු**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
(ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍ර: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 සැප්තැම්බර් 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ හරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.